# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2015 මාර්තු මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

(2015.03.30 දින නිකුත් කරන ලදී)

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 20.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු අනුප්‍රමාණය 11% කින් අඩු කිරීමෙන් හඳුන්වා දීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ කාලය තුළ දී පමණක් SVAT යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් විසින් බදු විලම්භනය කිරීම සීමා කිරීම වේ.

**3 වන වගන්තිය** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මාස 3ක කාල සීමාවක් සඳහා සම්පූර්ණ පිරිවැටුම රුපියල් මිලියන 100 ක් ඉක්මවනු ලබන තොග හෝ සිල්ලර වෙළඳාම සම්බන්ධයෙන් වගකීමක් දීර්ඝ කිරීම වේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ කල්බදු අවසන් කිරීම පිළිබඳ තීරණය කිරීම සඳහා වන කොන්දේසිය ඉවත් කිරීම වේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ SVAT යෝජනා ක්‍රමය යටතේ කාර්යාල මිලදී ගැනීම ලියාපදිංචි කිරීම දීර්ඝ කිරීම වේ.

*7 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ලියාපදිංචිය සඳහා යටත්වන ප්‍රවේශයක් දීර්ඝ කිරීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම වගන්තිය මගින් දේශීය ආදායම් නිල වෙබ් අඩවිය ප්‍රසිද්ධ කිරීම සඳහා සහ මාසිකව යාවත්කාලීන කරනු ලැබිය හැකි අක්‍රීය ලිපි ගොනු ප්‍රසිද්ධ කිරීම සඳහා විධිවිධාන සලස් වනු ලබයි.

*9 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය පනතේ 16 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*10 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය පනතේ 16 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය පනතේ 16 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*12 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මූල්‍ය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා අදාළ වන මාර්ගෝපදේශ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*13 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය ප්‍රවේශ ලියාපදිංචිය මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*14 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය බදු අනුප්‍රමාණය 11% දක්වා අඩු කිරීම සඳහා කරනු ලැබූ සංශෝධනයට ආනුෂංගික වේ.

***15 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මූල්‍ය සේවා මත කල්බදු ගනු දෙනු සඳහා වැට් බදු අය කිරීම වේ.

***16 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් විද්‍යුත් සන්නිවේදනය සහ විද්‍යුත් මාර්ග භාවිතය පිළිබඳ විධිවිධාන සලස්වනු ලබන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබයි.

***17,18,19,20,21,22, සහ 23 වන වගන්ති*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26,28,34,41,44,47 සහ 66 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධන මේ පනතේ 16 වන වගන්තිය මගින් කරන ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***24 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වගන්තියේ "බදු අය කළ හැකි කාලසීමාව" යන යෙදුම සඳහා වූ අර්ථනිරූපණය සංශෝධනය කරනු ලබයි.

***25 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ II වන කොටසේ සඳහන් ඇතැම් නිදහස් කිරීම් හඳුන්වාදීම සිදු කරනු ලබයි.

***26 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් වඩාත් හොඳින් පැහැදිලිකර දීම සඳහා 2014 අංක 7 දරන පනතේ 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලැබූ සංශෝධනය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්.ඩී.-ඕ. 16/2015

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

**1.** (1) මේ පනත 2015 අංක      දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි ඇතැම් විධිවිධාන බලාත්මක වන දිනය එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇත්නම් මිස, සහ මෙහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත 2015 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

(2) මෙම පනතේ 17, 19, 21, 25අ(5), 26, 28, 34, 41, 44, 47 සහ 66 වන වගන්තිවලට සිදුකරන ලද සංශෝධන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක දක්වා ඇති යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iii) වන අයිතමයේ, "(iii) 2010 නොවැම්බර් මස 23 වන දිනයෙන් ආරම්භ වන" යන වචන සහ ඉලක්කම්වල සිට "බදු අය කළ යුතු ය." යන වචන සහ ඉලක්කම් දක්වා වූ කොටස ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(iii) 2010 නොවැම්බර් මස 23 වන දිනයෙන් ආරම්භ වන සහ 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2014 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28ක් වේ); සහ

2—PL 008877—450 (2015/03)

(iv) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට එකොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 11/111 වේ),

ශුන්‍ය අනුප්‍රමාණය මත බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා හැර, එම සපයන ලද භාණ්ඩ හෝ සේවාවල වටිනාකම හෝ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම අනුව බදු අය කළ යුතු ය.”.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) අනුඡේදයේ (vi) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන්:—

“(vi) එකී සැපයුම් ව්‍යාපෘතිය හා සම්බන්ධිත සැපයුම්වන තාක් කල් ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන කාලය තුළ දී, සරල කරන ලද එකතුකළ අගය මත බදු යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති තැනැත්තන් වෙතින් මිලදී ගැනීම් සඳහා අවසර දී ඇත්තා වූ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (i) වන අනුඡේදයේ දක්වා ඇති පරිදි, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව වන යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ඇතුළුව, මේ පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු වෙත;”.

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) අනුඡේදයේ, “ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති නියමයේ සහ” යන වචන වෙනුවට “ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති සහ” යන වචන ආදේශ කිරීමෙන්.

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ දෙවන අතුරුවිධානයේ (ii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(ii) මේ පනතේ 22 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන යටතේ, එහි නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව අනුමත කරනු ලබන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ද ඇතුළුව, 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ සඳහන් යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන්නා වූ ව්‍යාපෘතියට සම්බන්ධ යම් භාණ්ඩ, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ, "මේ වගන්තියේ ඉහතින්ම වූ ඡේද යටතේ වන" යන වචනවල සිට "තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්" යන වචන දක්වා වූ කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඊ) මේ වගන්තියේ ඉහතින් ම වූ ඡේද යටතේ වූ සැපයුම් සහ පළමුවන උපලේඛනයේ II වන කොටස යටතේ නිදහස් කර ඇති යම් සැපයුම් ද ඇතුළුව යම් ලිත් වර්ෂයක අනුයාත මාස තුනක කාලසීමාවක් සඳහා -

(i) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන, එහෙත්, 2013 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර අවසන්වන කාලසීමාව තුළට ගැනෙන මාස තුනක යම් කාලසීමාවක් සඳහා රුපියල් මිලියන පන්සියයකට නොඅඩු;

(ii) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන, එහෙත්, 2014 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර අවසන්වන කාලසීමාව තුළට ගැනෙන මාස තුනක යම් කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු;

(iii) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් කාලසීමාවක් තුළට ගැනෙන යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන සියයකට නොඅඩු,

සමස්ත භාණ්ඩ සැපයීමක් ඇති යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක්,";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (i) වන ඡේදයේ, "වෙළඳාමේ යෙදී සිටින තැනැත්තෙකුගේ හෝ හවුල් ව්‍යාපාරයක; සහ" යන වචන වෙනුවට "වෙළඳාමේ යෙදී සිටින තැනැත්තෙකුගේ හෝ හවුල් ව්‍යාපාරයක අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු වන එවැනි වෙනත් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල; සහ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (10) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(10) 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා,

(අ) කල්බදු ගිවිසුමක් යටතේ සපයන ලද යම් භාණ්ඩ, එම කල්බදු ගිවිසුම අවසානයේ දී, කල්බදු ගිවිසුමේ සමස්ත ප්‍රතිෂ්ඨාවෙන් සියයට දහයක් නොඉක්මවන ප්‍රතිෂ්ඨාවකට බදු ගැනුම්කරුට පසුව පවරනු ලබන අවස්ථාවක, එම ප්‍රතිෂ්ඨාව එම කල්බදු ගිවිසුම යටතේ ලබා ගන්නා ලද බදු කුලියක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම ප්‍රතිෂ්ඨාව කල්බදු ගිවිසුමේ සමස්ත ප්‍රතිෂ්ඨාවෙන් සියයට දහයකට වැඩි වන අවස්ථාවක, එය වෙනම සැපයුමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) 2015 ජනවාරි මස 1 වන දින හෝ එම දිනට පසුව වූ යම් කාලසීමාවක් සඳහා, යම් කල්බදු ගිවිසුමක් අවසන් කිරීමේ දී එම කල්බදු ගිවිසුම යටතේ සපයනු ලබන භාණ්ඩ යම් ප්‍රතිෂ්ඨා

මුදලක් සඳහා පසුව බදු ගැනුම්කරු වෙත පවරනු ලබන අවස්ථාවක දී, කල්බදු ගිවිසුමේ ප්‍රතිෂ්ඨා මුදල් අය කර ගැනීම කල්බදු වාරිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (vii) වන අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(vii) විදේශීය ගැනුම්කරුවන්ට ඇගලුම් අපනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම පිණිස අත්‍යවශ්‍ය සේවාවක් බවට කොමසාරිස්-ජනරාල්වරයා විසින් හඳුනාගනු ලබන තාක් දුරට, අවස්ථාවෝචිත පරිදි, 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත යටතේ පිහිටුවා ඇති රෙදිපිළි පංගු මණ්ඩලය හෝ සරල කරන ලද එකතුකළ අගය මත බදු යෝජනාක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය ගැනුම්කරුවන් සඳහා රෙදිපිළි මිලදී ගැනීමේ කාර්යාලයක් විසින් සපයනු ලබන්නා වූ සහ විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා ගෙවීම් ලැබෙන්නා වූ සේවා සැපයීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය එහි පළමුවන අතුරුවිධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"එසේ වුව ද, මේ පනතේ 3 වන වගන්තියේ (ඊ) ඡේදයේ දක්වා ඇති ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,

(අ) ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ;

(ආ) දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරි; සහ

(ඇ) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ අඩංගු විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, සැපයුම, එම භාණ්ඩ ආනයනය කළ ආනයනකරු ඔහු විසින් ම කරනු ලබන අවස්ථාවක, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් එම භාණ්ඩ,

සැපයුම්වල වටිනාකම හැර, එම ලියාපදිංචි තැනැත්තාගේ සමස්ත භාණ්ඩ සැපයුමේ වටිනාකම සියයට විසිපහක් ඉක්මවන, මේ පනත යටතේ නිදහස් කරන ලද භාණ්ඩ සැපයුමෙහි වටිනාකම, එම ලියාපදිංචි තැනැත්තා විසින්, කෙලින්ම හෝ වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන් කරනු ලබන එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත් සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර, බද්ද ඇතුළත් ප්‍රතිෂ්ඨාව මත වන බදු ඛණ්ඩය භාවිතා කරමින් මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණය අනුව බද්දට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ:—

(i) (iii) වන ඡේදයේ "(iii) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු", යන වචන සහ ඉලක්කම් වෙනුවට "(iii) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු, එහෙත්, 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) (iii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(iv) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු, ශ්‍රී ලංකාව තුළ යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් සිදු කරනු ලබන හෝ කරගෙන යනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින් -

(අ) අවස්ථාවෝචිත පරිදි, බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, අවස්ථාවෝචිත පරිදි, එම එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරන ලද භාණ්ඩ හෝ

සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්තවටිනාකම රුපියල් මිලියන තුනයි හත්ලක්ෂ පනස් දහසක් වේ නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන පහළොවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඊළඟ එක් මාසයක හෝ මාස තුනක බදු අයකළ හැකි කාලසීමාව තුළ එම තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුනයි හත් ලක්ෂ පනස් දහසක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉනික්බිතිව ම වූ බදු අය කළ හැකි මාස දොළහක කාලසීමාව සඳහා රුපියල් මිලියන පහළොවක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.”.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, “සමස්ත සැපයුම්වල වටිනාකමට රුපියල් මිලියන දෙසිය පනහකට අඩු නොවන්නේ නම් මිස,” යන වචනවල සිට එහි අවසානය දක්වා ඇති වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"සමස්ත සැපයුම්වල වටිනාකමට-

(අ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන, එහෙත් 2014 දෙසැම්බර් මස 31 වන දින අවසන් වන යම් කාලසීමාවක් තුළට ගැනෙන මාස තුනක යම් කාලසීමාවක් සඳහා රුපියල් මිලියන පන්සියයකට නොඅඩු වන්නේ නම් මිස;

(ආ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වී එහෙත් 2015 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවක් තුළට ගැනෙන මාස තුනක යම් කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දෙසියපනහකට නොඅඩු වන්නේ නම් මිස; සහ

(ඇ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන සියයකට නොඅඩු වන්නේ නම් මිස,

යම් තොග හෝ සිල්ලර වෙළඳ ක්‍රියාකාරකමක දී සැකසීමකින් තොරව දේශීය වශයෙන් මිල දී ගනු ලැබූ භාණ්ඩ සැපයුම්වල වටිනාකම ඇතුළත් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ආදායමේ ආරක්ෂාවට බාධාවක් විය හැකි බවට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමකට පත් වූ විටක -

(අ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, ඒ ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය කොමසාරිස් - ජනරාල්වරයා විසින් අවලංගු කිරීම හෝ එසේ අවලංගු කිරීමට පෙරාතුව වැඩිදුර පරීක්ෂණ කරන

තෙක් මේ පනතේ කාර්යය සඳහා එම ලියාපදිංචිය අක්‍රීය ලියාපදිංචියක් ලෙස ලැයිස්තුගත කළ යුතු ය;

(ආ) කවර හෝ වේලාවක කොමසාරිස් - ජනරාල්වරයා විසින් ලියාපදිංචිය අවලංගු කිරීම හෝ එසේ අවලංගු කිරීමට පෙරාතුව වැඩිදුර පරීක්ෂණ කරන තෙක් මේ පනතේ කාර්යය සඳහා එම ලියාපදිංචිය අක්‍රීය ලියාපදිංචියක් ලෙස ලැයිස්තුගත කළ යුතු ය;

(2) එම වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2අ) කොමසාරිස් - ජනරාල්වරයා විසින් -

(අ) (2)වන උපවගන්තිය යටතේ වන යම් ලියාපදිංචියක් අවලංගු කරනු ලබන අවස්ථාවක, ඔහු විසින්, එම ලියාපදිංචි තැනැත්තන්ගේ නම් සහ ලියාපදිංචි අංක ඇතුළත් ලැයිස්තුවක් පුළුල් සංසරණයක් ඇති, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ දිනපතා පුවත්පත් තුනක ප්‍රසිද්ධ කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය; හෝ

(ආ) එම ලියාපදිංචිය අක්‍රිය ලෙස තීරණය කරනු ලබන අවස්ථාවක, 73 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එසේ ලියාපදිංචිය අක්‍රිය ලෙස තීරණය කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලියාපදිංචි අංක දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර, එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ ලැයිස්තුව, මාසිකව යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් මගින්-" යන වචන යෙදෙන සෑම අවස්ථාවක දී ම ඒ වචන වෙනුවට "ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ දැන්වීමක් මගින්-" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "ලිඛිතව දැනුම් දිය යුතු ය." යන වචන වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් දැනුම් දිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය හැර එහි "ලිඛිත" යන වචනය යෙදෙන සෑම අවස්ථාවක දී ම ඒ වෙනුවට "ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) එම වගන්තියේ (6) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරුවිධානය ආදේශ කිරීමෙන්:—

එසේ වුව ද, (2) වන උපවගන්තියේ විධිවිධානවල සහ මේ පනතේ පළමුවන උපලේඛනයේ (II) වන කොටසේ (ඊ) අනුඡේදයේ (i) වන සහ (ii) වන අයිතමවල නිශ්චිතව දක්වා ඇති ව්‍යතිරේකවල කුමක් සඳහන් ව ඇත ද, එය නොතකා,

(අ) රජය විසින් ගෙවීම් දරනු ලබන ඉහත (ii) වන අයිතමයේ දක්වා ඇති යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීමේ යෙදී සිටින යම් ලියාපදිංචි තැනැත්තකුට; හෝ

(ආ) එම සැපයීම්, ව්‍යාපෘති ආශ්‍රිත සීමාවේ නම් හා 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වූ විධිවිධානවලට ගැනෙන එකී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය මගින් ඉල්ලා සිටීමට ඉඩ දී ඇති ව්‍යාපෘතියකට සම්බන්ධ සැපයුම් වන්නේ නම්, ඉහත (i) වන අයිතමයේ දක්වා ඇති යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීමේ යෙදී සිටින යම් ලියාපදිංචි තැනැත්තකුට;

එම ව්‍යාපෘති සඳහා සපයනු ලබන භාණ්ඩවලට හෝ සේවාවලට සම්බන්ධිත භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම මත යෙදවුම් බද්ද අයකර ගැනීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය:";

(2) එම වගන්තියේ (13) වන උපවගන්තියේ, "තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද" යන වචන වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ මාර්ගෝපදේශ සහ තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, "2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වූ" යන වචන හා ඉලක්කම් වෙනුවට "2013 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව, එහෙත්, 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඇ) එම සපයනු ලබන මූල්‍ය සේවාවේ අගය, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තුනයි හත්ලක්ෂ පනස්දහසක් ඉක්මවන අවස්ථාවක හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන පහළොවක් ඉක්මවනු ලබන අවස්ථාවක දී, එම ලියාපදිංචිය 2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වූ යම් කාලසීමාවක් සඳහා සිදු වූයේ නම්.".

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ, "ලිඛිතව" යන වචන වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්" යන වචන ආදේශ කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඈ වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඈ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "සියයට විස්සක් විය යුතු ය;" යන වචන වෙනුවට "සියයට විස්සක් විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඈ) 2011 ජනවාරි මස 1 වන දින සිට ආරම්භවන, එහෙත්, 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව සියයට දොළහක් විය යුතු ය."; සහ

(3) එම උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඉ) 2015 ජනවාරි මස 1 වන දින සිට, ආරම්භවන යම් කාලසීමාවක් සඳහා සියයට එකොළහක් විය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තියේ (ඌ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම ඡේදයේ (ආ) අනුඡේදයේ "එම භාණ්ඩ සැපයුම;" යන වචන වෙනුවට "එම භාණ්ඩ සැපයුම; හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) එම ගිවිසුම 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් ප්‍රතිලේඛනගත කිරීම සඳහා වන ගිවිසුමක් නොවන 2014 ඔක්තෝබර් මස 25 දින හෝ ඊට පසුව ඇතුළත් වී ඇති ගිවිසුමක් වන්නේ නම්, ඉඩම් හෝ ගොඩනැගිලි හැර, යම් වත්කමක් පිළිබඳ වූ මූල්‍ය කල්බදු ගිවිසුමක් හෝ මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ වූ කල්බදු පහසුකම්.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 25ඔ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඒ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඔ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතය.

25ඔ. අමාත්‍යවරයා විසින්, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයාගේ නිර්දේශය මත 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතය සඳහා බලය පැවරීමේ හෝ ඒ සඳහා පහසුකම් සැලසීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලියවිල්ලකින්" යන වචනය වෙනුවට "ලියවිල්ලකින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලියවිල්ලක් මගින්" සහ "ලියවිල්ලකින් වූ" යන වචන වෙනුවට පිළිවෙළින් "ලියවිල්ලක් මගින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින්" හෝ "ලියවිල්ලකින් වූ හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලිඛිත" යන වචනය වෙනුවට "ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලිඛිතව වූ" යන වචන වෙනුවට "ලිඛිතව වූ හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ "ලිඛිත" යන වචනය වෙනුවට "ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ "ලිඛිත" යන වචනය වෙනුවට "ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ "ලියවිල්ලක් මාර්ගයෙන්" යන වචන වෙනුවට "ලියවිල්ලක් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මාර්ගයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියේ "බදු අය කළ හැකි කාලසීමාව" යන අර්ථනිරූපනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (අ) ඡේදයට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(1) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා -"; සහ

(2) (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(2) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් කාලසීමාවක් සඳහා -

(අ) (i) යම් තැනැත්තෙකු, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ දක්වා ඇති කාර්ය සඳහා කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිකුත්කරනු ලබන සහ ගැසට් පත්‍රයේ පළකරනු ලබන මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනාක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සහ එම තැනැත්තාට හඳුනාගත් ලියාපදිංචි ගැනුම්කරුවෙකුගේ තත්ත්වය පිරිනමා ඇති අවස්ථාවක, එම තැනැත්තා සඳහා;

(ii) යම් තැනැත්තෙකු, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ සහ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා එකඟ වෙමින් යම් ව්‍යාපාරයක් ආරම්භකර ඇති හෝ ව්‍යාපෘතියක් ආරම්භකර ඇති අවස්ථාවක, එම තැනැත්තා සඳහා,

(25ආ වගන්තියේ දක්වා ඇති විශේෂිත ආයතන සම්බන්ධයෙන් හැර), එක් මාසයක කාලසීමාවක් අදහස් වේ;

(ආ) ඉහත (අ) ඡේදයේ දක්වා ඇති තැනැත්තකු නොවන, කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය මත කාර්තුමය වාර්තා භාරදීම සඳහා එකඟ වූ තැනැත්තෙකු වන යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන්, එක් එක් අවුරුද්දේ පිළිවෙළින් ජනවාරි මස පළමුවන දින, අප්‍රේල් මස පළමුවන දින, ජූලි මස පළමුවන දින සහ ඔක්තෝබර් මස පළමුවන දින සිට ආරම්භවන මාස තුනක කාලසීමාවක් අදහස් වේ;".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ ශීර්ෂයේ "2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා." යන වචන සහ ඉලක්කම් වෙනුවට "(උපලේඛනයට පසුව එළඹෙන සංශෝධනවල නිශ්චිතව දක්වා ඇති බලාත්මකවීමේ දිනවලට යටත්ව) 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා-". යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කිරීම.

(2) එම කොටසේ (අ) ඡේදය එහි (xxv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(xxvi) ඊතයිල් ඇල්කොහොල් නිෂ්පාදනය කිරීමේ දී සුරා බදු ආඥාපනත යටතේ වූ බද්දට හෝ ආනයනය කිරීමේ දී රේගු බද්ද සහ සෙස් බද්දට යටත් ව අතුරු නිෂ්පාදනයක් වශයෙන් ආනයනය කරනු ලබන සහ සපයනු ලබන එම ඊතයිල් මධ්‍යසාර.".

(3) එම කොටසේ (ආ) ඡේදයේ -

(අ) එම කොටසේ (ii) වන අයිතමයේ (ආ) අනුඡේදයේ (අ) අයිතමයේ (ii) වන අනු - අයිතමයේ "මෝටර් කෝච් රථයක් සඳහා" යන වචන වෙනුවට "එම මෝටර් කෝච් රථයක් සඳහා, 2014 ඔක්තෝබර් මස 24 වන දින හෝ ඉන් පෙර එම ගිවිසුමට එළඹ ඇත්නම්;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;";

(ආ) එම කොටසේ (ii) වන අයිතමයේ (ආ) අනුඡේදයේ (අ) අයිතමයේ (iii) වන අනු-අයිතමයේ "මාර්ග ට්‍රැක්ටර් හෝ ප්‍රයිම් මූවර්." යන වචන වෙනුවට "මාර්ග ට්‍රැක්ටර් හෝ ප්‍රයිම් මූවර් සඳහා, 2014 ඔක්තෝබර් මස 24 වන දින හෝ එදිනට පෙර එම ගිවිසුමට එළඹ ඇත්නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම කොටසේ (ii) වන අයිතමයේ (ආ) අනුඡේදයේ (ආ) අයිතමයේ "2005 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම ගිවිසුමට 2014 ඔක්තෝබර් මස 24 වන දින හෝ එදිනට පෙර එළඹී ඇත්නම්, 2005 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම කොටසේ (ii) වන අයිතමයේ (ආ) අනුඡේදයේ (ඇ) අයිතමයේ "බස් රථයක් සඳහා," යන වචන වෙනුවට "බස් රථයක් සඳහා, එකී ගිවිසුමට 2014 ඔක්තෝබර් මස 24 වන දින හෝ එම දිනයට පෙරාතුව එළඹී ඇත්නම්;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) (i) එම කොටසේ (බ) අයිතමයේ (උ) අනුඡේදයේ (ආ) අයිතමයේ-

(i) "භාණ්ඩ සැපයීමේ විධිවිධාන;" යන වචන වෙනුවට "භාණ්ඩ සැපයීමේ විධිවිධාන; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) එම කොටසේ (බ) අයිතමයේ (උ) අනුඡේදයේ (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනු අයිතමය එකතු කිරීමෙන්:—

"(ඇ) එම ගිවිසුම 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් ප්‍රතිලේඛනගත කිරීම සඳහා වන ගිවිසුමක් නොවන්නා වූ 2014 ඔක්තෝබර් මස 25 වන දින හෝ ඉන්පසුව ඇතුළත් වී ඇති ගිවිසුමක් වන්නේ නම්, ඉඩම් හෝ ගොඩනැගිලි හැර යම් වත්කමක් මත මූල්‍ය කල්බදු ගිවිසුමක් හෝ මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ වූ කල්බදු පහසුකම්;".

(ඊ) එම කොටසේ (xi) වන අයිතමයේ "ඒ ව්‍යාපෘතිය තනිකරම නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම හෝ කුලියට දීම සඳහා වන" යන වචන වෙනුවට " ඉහත කී ව්‍යාපෘතිය තනිකරම හෝ අර්ධ වශයෙන් නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම, කුලියට දීම සඳහා වන" යන වචන ආදේශ කරීමෙන්;

(උ) එම කොටසේ (උ) අනුඡේදයේ (xiii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xiii) ආනයනය කරන ලද-

(අ) පිරිසැකසුම් නොකළ දැව කඳන්, නැව් හෝ වේවැල්; සහ

(ආ) යම් භාණ්ඩ විකිණීම සඳහා සැකසීම පිණිස කරනු ලබන පිරිසැකසුම් කිරීමක් හැර, යම් පිරිසැකසුම් කිරීමකින් තොරව විකිණීමේ කොන්දේසියට යටත්ව 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත්වන යම් ද්‍රව්‍යයක්;";

(උ) එම කොටසේ (උ) අනුඡේදයේ (xxxi) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xxxi) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්දට යටත් විදුලි සංදේශ සේවා සහ එම පනතේ විදුලි සංදේශ සේවා යන යෙදුමේ අර්ථ නිරූපණයේ එම වගකීමෙන් විශේෂයෙන් බැහැරකර ඇති සේවාවන්;" (2014 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වේ).

(4) එම කොටසේ (ඇ) ඡේදයේ -

(අ) එම ඡේදයේ (xxx) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතම ආදේශ කිරීමෙන්:—

"(xxx) රේගු අධ්‍යක්ෂ- ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් ව -

(අ) 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව කරනු ලබන ආනයන මත රුපියල් විසි පන්දහසක් නොඉක්මවන; සහ

(ආ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව වූ යම් කාලසීමාවක් සඳහා එවැනි ආනයන මත රුපියල් පනස් දහසක් නොඉක්මවන

වටිනාකමක් ඇති ව්‍යාපාරයකට අදාළ සාම්පල;”; සහ

(ආ) එම ඡේදයේ (xxxvii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:—

“(xxxviii) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වරායන් තුළ පමණක් භාවිතා කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබා දෙන යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ අමතර කොටස්”.

(5) එම කොටසේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:—

“(ඕ) 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව එළඹෙන ලද යම් කල්බදු ගිවිසුමක් යටතේ සපයන ලද යම් මෝටර් වාහනයක් හැර, 2014 ඔක්තෝබර් මස 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ආනයනය කරන ලද හෝ සපයන ලද -

(අ) (i) රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත්, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ආනයනය කිරීමේ දී නිෂ්පාදන බද්දට යටත්වන මෝටර් වාහන සහ නිෂ්පාදනය කිරීමේ දී එම බද්දට ම යටත්වන එවැනි යම් මෝටර් වාහනයක්;

(ii) 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසු ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම කරන ලද්දේ නම්, එම ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම එවැනි ම ආකාර

වූ බද්දකට යටත්වන 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී ඉතිරිව පවතින යම් මෝටර් වාහනයක්,

යෙදවුම් බද්ද සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කර ඇති යම් බදු දීමනාකරුවකු විසින්, පිරිසැකසුම් කිරීමෙන් පසු බැහැරකරනු ලැබූ විට, එවැනි යම් මෝටර් වාහනයක්;

(ආ) ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත්වන, සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බද්දට යටත්වන, 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී තොග වශයෙන් ඉතිරිව පවතින සිගරට් ද ඇතුළුව රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් සහ 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසුව ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම කරන ලද්දේ නම්, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත්වන සිගරට්; හෝ

(ඇ) ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට සහ රේගු බද්දට සහ සෙස් බද්දට යටත්වන, 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී ඉතිරිව පවතින සහ 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ආනයනය කර හෝ නිෂ්පාදනය කර ඇති මත්පැන් ඇතුළුව රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසුව ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම කරන ලද්දේ නම්, ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී සෙස් බද්දට සහ රේගු බද්දට යටත්වන මත්පැන්;"

2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට හඳුන්වාදෙනු ලැබූ සංශෝධනය, එහි (ඇ) ඡේදය සහ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(ඇ) ප්‍රධාන ප්‍රඥප්තියේ "ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු" යන වචන යෙදී ඇති සෑම ස්ථානයක් සඳහා ම "නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන වචන ආදේශ කිරීමෙන්.

වලංගු භාවය.

**27.** 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, මෙම පනත සම්බන්ධයෙන් කතානායකවරයාගේ සහතිකය සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු රැස් කිරීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරී බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම වලංගු ලෙස සිදු කර ඇති හා සිදුව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් උපචිත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ.

එසේ වුව ද, එම කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බදු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයන් හෝ නියෝගයන් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.